// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2355/31 - 2023 ඔක්තෝබර් මස 25 වැනි බදාදා - 2023.10.25

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ මුද්‍රණ සේවයේ සේවා ව්‍යවස්ථාව

පළමු සංශෝධනය

2015 අගෝස්තු 21 දිනැති හා අංක 1928/24 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ මුද්‍රණ සේවයේ සේවා ව්‍යවස්ථා සංග්‍රහය පහත දැක්වෙන ආකාරයට සංශෝධනය කරනු ලැබේ. එහි සඳහන් අනෙකුත් කරුණු හා කොන්දේසි නොවෙනස්ව පවතී.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගය පරිදි,

ඩබ්ලිව්. එච්. එම්. එම්. සී. කේ. දයාරත්න,
ලේකම්,
රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

2023 ඔක්තෝබර් මස 20 වැනි දින.

11. තනතුරට පත්කිරීම

මුද්‍රණාල පරිපාලක - 2 පන්තියේ I ශ්‍රේණියේ වැඩමූලික තනතුරක් දරනු ලබන නිලධාරියකු විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් ජ්‍යෙෂ්ඨතාවය අනුව පත්කරනු ලැබේ.

*සටහන*

අදාළ සුදුසුකම් සහිත නිලධාරියකු නොමැති අවස්ථාවකදී, පැරණි සේවා ව්‍යවස්ථාව අනුව 3 පන්තියේ I ශ්‍රේණියේ හා මෙම සේවා ව්‍යවස්ථාවේ 2 පන්තියේ III ශ්‍රේණියේ ඒකාබද්ධ සේවා කාලය වසර 10ක් සම්පූර්ණ කර ඇති සහ වැඩමූලික තනතුරේ වසර 10කට වැඩි සේවා පළපුරුද්දක් සහිත නිලධාරියකු විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් ජ්‍යෙෂ්ඨතාවය අනුව මුද්‍රණාල පරිපාලක තනතුරට පත්කරනු ලැබේ.

EOG 10-0258

1A - G 40598 — 07 (2023/10)
ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*